# මහනුවර මහා නගර සභාව

# 2025 වර්ෂය සඳහා

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2025 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීමට සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගැනීම පිණිස නිෂ්පාදකයින්ගෙන්, ලියාපදිංචි ආයතනවලින් හා පුද්ගලයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**<u>(01)සැපයුම්</u>**

01. ආයුර්වේද ඖෂධ වර්ග.
02. බටහිර ඖෂධ වර්ග සහ වෛද්‍ය උපකරණ.
03. රසායනාගාර උපකරණ, රසායනාගාර රසායන ද්‍රව්‍ය
04. ගිනිනිවීමේ උපකරණ (සවිකිරීම් ඇතුළුව)
05. සාමාන්‍ය ගබඩා ද්‍රව්‍ය (යකඩ, ජීඅයිපයිප්ප, කම්බි, නාන කාමර හා වැසිකිලි අමතර කොටස්, ප්ලාස්ටික් ජලටැංකි, කොම්පෝස්ට් බැරල්, සෙවිලි ද්‍රව්‍ය
06. තීන්ත වර්ග සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය.
07. සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ (ඉදල්, කොසු, වේවැල් කූඩා, ප්ලාස්ටික් කුණු කූඩා, විම්, හාපික්, සබන්වර්ග, පයිනෝල්, අත්වැසුම් ආදිය)
08 පාවහන්, සපත්තු මේස් ආදිය.
09. නිලඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග සහ ටී ෂර්ට්
10. ක්‍රීඩා භාණ්ඩ සහ කායවර්ධන උපකරණ ආදිය
11. ටයර්, ටයර් ටියුබ් සහ බැටරි (වාහනසඳහා)
12. රථ වාහන අමතර කොටස් (වෑන්, මෝටර් සයිකල්, ට්‍රැක්ටර්, ගල්රෝල්,ටිපර් ත්‍රීවිලර් රථ, බැකෝ ඇතුලු සියලූ වාහන වල අළුත් සහ භාවිතා කරන ලද අමතර කොටස්)
13. කාර්යාල විදුලි උපකරණ ( එකතු කිරීමේ යන්ත්‍ර කේතල් විදුලි පංකා ආදිය)
14.CCTV කැමරා,ඇඟිලි සලකුණු යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපාංග
15. කාර්යාල උපකරණ ලී සහ වානේ ගෘහ භාණ්ඩ (රාක්ක, අල්මාරි, මේස, ලිපිගොනු කැබිනට් ප්ලාස්ටික් පුටු ආදිය)
16. පරිගණක යන්ත්‍ර,ඡායා පිටපත් යන්ත්‍ර ෆැක්ස් යන්ත්‍ර සහ අනු පිටපත් යන්ත්‍ර බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය)
17. විදුලි සේවාවන් සැපයීමට අවශ්‍ය උපාංග (වයර්/ ස්විච්/ බල්බ්/ ප්ලග් ආදිය)
18. කාර්යාලීය ලිපිද්‍රව්‍ය, පරිගණක රිබන්, කාට්රිජ් ටෝනර් ආදිය
19. මුද්‍රණ කටයුතු (මුද්‍රිත පෝර්ම සහ පොත්පත්, දිනමුද්‍රා සහ රබර්මුද්‍රා)
20. ගොඩනැගිලි ද්‍රව්‍ය (වැලි, ගල්, මැටල් ආදිය)
21. හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, සිමෙන්ති බ්ලොක් ගල්, කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ආදිය

22. සිමෙන්ති, කොන්ක්‍රීට් පෙරමුසු (Ready mix), ප්‍රිමික්ස් ආදිය

23. ඉරන ලද දැව (ලෑලි, පරාල ආදිය)

24. ලිහිසි තෙල්

25. ඉමල්පත් තාර

26. පොහොර සහ රසායනික ද්‍රව්‍ය (රසායනික පොහොර සහ සත්ව පොහොර)

27. ජලය පිරිපහදු කිරීමේ රසායනික ද්‍රව්‍ය

(හයිඩ්‍රේටඩ්ට් ලයිම්, ඇලුමිණියම්, සල්ෆේට්, ක්ලෝරීන්, ටී.සී.එල්. පවුඩර් ආදිය)

28. ජල පොම්ප සඳහා බෙයාරිං

29. පීවීසී උපකරණ (ඩී.අයි.ජී.අයි. ජල නල උපාංග යනාදි භාණ්ඩ සහ අමතර කොටස්)

30. ජල මීටර්, ජල පොම්ප, ජල මෝටර්, ජල පිරිපහදු කිරීමේ විදුලි උපකරණ, ජල පිරිපහදු කිරීමේ පද්ධතියට අවශ්‍ය උපකරණ ආදි භාණ්ඩ සඳහා අවශ්‍ය අමතර කොටස්

31. පොත්,පුවත්පත්, සගරාමිලදී ගැනීම

32 ආරක්ෂිත උපකරණ(කබා,හෙල්මට් ආදිය)

33 උද්‍යාන සඳහා අවශ්‍ය ගස් වර්ග, මල් පැල සහ තණ පිදලි

34. කැනපි, ටෙන්ට් රෙදි සහ තිරරෙදි ආදිය

35. පදක්කම්, පලිහ,පිත්තල නාමපුවරු, කුසලාන

36. විදුලි බලවේග කට්ටල (විදුලි කියත් ඩ්‍රිල් මැෂින් ආදිය)

02. **<u>සේවාවන්</u>**

37. ජල පොම්ප, ජල මෝටර්, ජලය පිරිපහදු කිරීමේ පද්ධතිය අලුත්වැඩියා කිරීම

38. රෝනියෝ යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම

39. පරිගණක යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම

40 පුටු විවීම සහ පුටු කුෂන් කිරීම සහ අලුත්වැඩියාව

41. ඇඟිලි සලකුණු යන්ත්‍ර , CCTV කැමරා අලුත්වැඩියා කිරීම

42. වාහන කුලියට සැපයීම (ට්‍රැක්ටර්, මගී වාහන, ටිපර්රථ, කම්පැක්ටර් රථ, ගස් කපන යන්ත්‍ර ආදිය

43. ටයර් නැවත පිරවීම සහ පැරණි ටයර් මිලදී ගැනීම

44. යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ කුලියට සැපයීම

45 සම්පත් පියස භාණ්ඩ විකිණීම (කාඩ්බෝඩ් යකඩ පිත්තල ප්ලාස්ටික් සහ කැබලි කරන ලද ප්ලාස්ටික් ආදිය)

46. කැනපි පුටු පිගන් කෝප්ප ආදිය උත්සව භාණ්ඩ කුලියට සපයා ගැනීම

47. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව

48. වෙනත්

ඉහත සඳහන් එක් එක් සැපයුම් සහ සේවාවන් සඳහා වෙන් වෙන්ව ලියාපදිංචි වීම සඳහා එක් අයිතමයක් වෙනුවෙන් රු2360/- VAT ඇතුලත් ගාස්තුවක් අයකරනු ලැබේ. ඒ සඳහා මුදල් ගෙවීමට අවශ්‍ය විස්තර පහත පරිදි වේ. 2024.10.02 සිට 2024.11.01 දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිටප.ව. 3.30 දක්වා මහා නගර සභාවේ සැපයුම් අංශයෙන් අයදුම්පත් ලබා ගත හැකි අතර නොඑසේනම් අපගේ වෙබ් අඩවියවන http://kandy.mc.gov.lk මගින් අයදුම්පත බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024.11.04 දින වේ. අයදුම්පත් සමග ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්ද,වැට් බදු ගෙවන්නේනම් ඒ සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ බැංකුව වෙත මුදල් ගෙවන ලද ලදුපතේ මුල්පිටපත අමුණා එවිය යුතු වේ.

| | | |
|---|---|---|
| මුදල් ගෙවිය හැකි බැංකුව | - | දිවයින තුල පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් |
| ගිණුමේ නම | - | නාගරික කොමසාරිස්, මහා නගරසභාව මහනුවර |
| ගිණුම්අංකය | - | **0000032764** |

බැංකු රිසිට්පතේ ඇති“තැන්පතුවේ අවශ්‍යතාවය” යන කොටසේ Supp/Reg 2025 ලෙස සඳහන් කරන්න.

**<u>ඉහත පරිදි විස්තර සඳහන් කර මුදලින් පමණක් ගෙවීම් සිදුකළ යුතුය.</u>** සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් ගණකාධිකාරි (සැපයුම්), මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට 2024.11.04 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ **<u>වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2025</u>** ලෙෂ සඳහන් කළ යුතුය. නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැපයුම්කරුවන් සඳහා කොන්දේසි**

i. ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව අවශ්‍ය අවස්ථාවලදී වෙනත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කර භාණ්ඩ මිලදී ගැනීමේ බලය මෙම සභාවට / නාගරික කොමසාරිස්ට ඇත.

ii. අවශ්‍ය අවස්ථාවලදී සාම්පල් හා ආකෘති ඉදිරිපත් නොකරන හා ඇණවුම් පරිදි නියමිත වේලාවට, ප්‍රමිතියට සහ උසස් ගුණාත්මක භාණ්ඩ නොසපයන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

iii. භාණ්ඩ සැපයූ දිනසිට අවම වශයෙන් දින 45 ක ණය පහසුකම් සැපයුම්කරුවන් විසින් ලබාදිය යුතුය.

iv. නියමිත පරිදි ප්‍රමිතියෙන්, හා ගුණාත්මක බවින් යුතුව අදාල පිරිවිතරවලට අනුකූලව භාණ්ඩ සැපයිය යුතුය. කිසිදු අවස්ථාවකදි සැපයුම්කරුවන් හට අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබේ.

වැඩි විස්තර ගණකාධිකාරි(සැපයුම්)ගේ දුරකතනඅංක 081-2232071 මගින් ලබා ගත හැකිය. සැපයුම්කරුවන් ලියාපදිංචිය පිළිබඳ අවසන් තීරණය නාගරික කොමසාරිස් සතුවේ.

2024.09. දින

මහා නගර සභාව

මහනුවර

ඒ.එච්.එම්.ඉන්දිකා කුමාරි අබේසිංහ

මහනුවර නාගරික කොමසාරිස්

නා.කො/ප්‍රනාග/ගණ (සැපයුම්)

**2025** වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පුවත්පත් දැන්වීම දිනපතා පලවන දිණමිණ පුවත්පතෙහි පල කිරීමටත් , දෙමළ භාෂාවට පරිවර්තනය කර තිණකරණ් පුවත්පතෙහි පල කිරීමටත්. ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඩේලි නිව්ස් පුවත්පත් පතෙහි පල කිරීම සඳහාත් අනුමැතියට කාරුණිකව ඉදිරිපත් කරමි.